සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

16 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ....................................... ඉස්ලාම් ධර්මය I කාලය : පැය 01යි.

වැදගත් :

✳ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.

✳ 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(1) තක්බීර් තහ්රීම් යනු,
1. අවසාන තක්බීර් 2. ආරම්භ තක්බීර්
3. සුජුදෙහි උසුරීම. 4. රුකුවෙහි උසුරීම.

(2) නබිවරුන්, රසූල්වරුන් ගැන වූ විශ්වාසය අකීදාවෙහි කුමන කොටසට අයත් ද?
1. අල් ඉලාහියියාත් 2. අන්නුබුව්වාත්
3. අස් සම්ඉයියාත් 4. අර්රූහානියියාත්

(3) මුඃමින්වරුන් හා කාෆිර්වරුන් අතර ඇති වෙනස දැක්වීමට අදාළ යුතුකම වන්නේ,
1. සලාතය 2. සකාතය 3. සව්මය 4. හජ්

(4) තව්රාත් ආගම් ග්‍රන්ථය පහළ වූ භාෂාව කුමක්ද?
1. යූනානි 2. සුර්යානි 3. අරාබි 4. අබරානි

(5) ඉබාදතයෙහි අරමුණ නොවන්නේ,
1. මිනිසුන්ව තෘප්තිමත් කිරීම. 2. දේව භිය වැඩි කිරීම.
3. දෙවියන් වහන්සේට ළංවීම. 4. ස්වර්ගය යාමට මඟ පෑදීම.

(6) රුකූඋ, සුජූද් නොමැති සලාතය කුමක්ද?
1. වර්ෂාව පතා නැමදීම. 2. ග්‍රහණ සලාතය
3. ජනාසා සලාතය 4. පින් ලබාගැනීම සඳහා වූ සලාතය

(7) රසූල්වරුන්ගේ සංඛ්‍යාව,
1. 5 2. 12 3. 313 4. 124 000

(8) ''දූතභාවය'' අරාබි භාෂාවෙන් හැඳින්වෙන්නේ,
1. නුබුව්වත් 2. තහාරත් 3. රිසාලත් 4. හිදායත්

(9) පහත සඳහන් සලාත්වලින් ෆර්ල් සලාතය වන්නේ,
1. සලාතුල් ඊද් 2. සලාතුල් තහජ්ජද්
3. සලාතුල් ජුම් ආ 4. සලාතුල් විත්ර්

(10) සලාතයෙහි ෆර්ලුවලින් අවසාන ෆර්ලු වන්නේ,

1. සලාවක් කීම  2. ප්‍රාර්ථනා කිරීම.
3. ප්‍රථම සලාව කීම.  4. අත්තහියියාතයෙහි ඉඳීම.

(11) තව්හිදයෙහි විරුද්ධ පදය,

1. කුෆ්ර්  2. ෂිර්ක්  3. ඉල්හාද්  4. නිෆාක්

(12) මුඑඃ කිරීමේ ෆර්ල් වූ ශරීරයේ කොටසක් වන්නේ,

1. කන  2. මුහුණ  3. දණහිස  4. දත්

(13) අල්මාඋල් මුස්තඃමල් යනු,

1. භාවිතා කළ ජලය  2. අපිරිසිදු ජලය
3. පිරිසිදු ජලය  4. අතිශුද්ධ ජලය

(14) මුහම්මද් අම්පාරේ සිට වැලිගම බලා ගමන් කරමින් සිටියදී ලුහර් සලාතය අස්ර් සලාතය සමඟ ඉටු කළේය. මෙම සලාතය,

1. ජම්උ  2. කස්රු  3. ජම්උත් තක්දීම්  4. ජම්උත් තඃහීර් වේ.

(15) සුරතුල් හාතිහාවෙහි 'මාලිකි යව්මිද්දීන්' යන වැකියෙහි අර්ථය වන්නේ,

1. දයාවන්තයා  2. යහ මඟ පිහිටුවනු මැන
3. ඔබට නමදිමු  4. ප්‍රතිඵල දෙන දිනයෙහි අධිපතිය.

(16) අකීදාවෙහි ශුද්ධභාවය ආරක්ෂා කිරීමට වෙහෙස දැරූ ඉමාම්වරුන්ගෙන් කෙනෙකු වන්නේ,

1. ඉමාම් මාලික්  2. ඉමාම් අබු හනිෆා
3. ඉමාම් අහ්මද් බින් හන්බල්  4. ඉමාම් ෂාහිර්

(17) ධර්මය යන පදයෙහි අරාබි පදය වන්නේ,

1. වක්ෆු  2. හිදායක්  3. තස්කියා  4. සදකා

(18) දුආඋල් ඉස්තිෆ්තාහ් උසුරීමේ අවස්ථාව,

1. රුකුඋවෙහි  2. සුජු දෙහි
3. ආරම්භ තක්බීරයෙන් පසු  4. නැමදීමෙන් පසු

(19) මලාඉකවරුන් මවනු ලැබුවේ,

1. පස්වලින්  2. ආලෝකයෙන්  3. ගින්දර වලින්  4. සුළඟින්

(20) සුහුෆු දහය බැගින් පහළ වූ නබිවරුන්ගේ සංඛ්‍යාව,

1. 4  2. 3  3. 2  4. 1

(21) වචනවලින් සම්බන්ධ වූ ඉබාදත් වන්නේ,

1. හජ්  2. නෝම්බි  3. සකාත්  4. කුර්ආනයපාරායනා කිරීම.

(22) නජිසයක් ශරීරයේ තැවරුණහොත් එය පිරිසිදු කිරීමට භාවිතා කරන ජලය වන්නේ,

1. මාඋන් තාහිර්  2. මාඋන් මුස්තඃමල්  3. මාඋල් තහූර්  4. මාඋන් නජිස්

(23) නියත වශයෙන් කවුරුන් සිත පිරිසිදු කරගන්නේ ද ඔහු ජය ලැබුවේය. යනු,

1. කුර්ආනයේ වැකියකි. 2. නබි (සල්) තුමාණන්ගේ වැකියකි.
3. සහබිවරයෙකුගේ වැකියකි. 4. ඉමාම්වරයෙකුගේ වැකියකි.

(24) ''පව්වලින් මිදීම'' යන අදහස දෙන වැකිය වන්නේ,

1. ඉඃලාස් 2. වරළ 3. හිදායත් 4. තව්බා

(25) ''සුබ්හානල්ලාහ්'' යන පදයෙහි තේරුම,

1. අල්ලාහ් අති ශ්‍රේෂ්ඨ වේ. 2. අල්ලාහ් අති පාරිශුද්ධ වේ.
3. සියලු ප්‍රශංසා අල්ලාහ්ටය. 4. අල්ලාහ් නීතිපති වේ.

(26) පහත සඳහන් ඒවායින් සාමාන්‍ය නජීස් වන්නේ,

1. ඌරා 2. බල්ලා 3. ලේ 4. උණු වතුර

(27) සුරතුල් ෆලක්යෙහි ඇති වැකි ගණන,

1. 5 2. 6 3. 7 4. 8

(28) සලාතයෙහි ''ඉෆ්තිරාස් ඉඳීම'' යනු,

1. මැද හිඳුම 2. සුජුදෙහි හිඳීම.
3. අන්තිම අත්තහියියාත්යෙහි හිඳීම. 4. ඉඃතිදාල්හි සිටීම.

(29) ''වහි මත්ලුව්'' නැමති කොටසෙහි අඩංගු වන්නේ,

1. හදීස් 2. ඉජ්මා 3. සුන්නා 4. කුර්ආන්

(30) වුළුඃ වෙනුවට ඉටුකරන ක්‍රියාව නම්,

1. තහාරත් 2. ජබීරත් 3. කයම්මුම් 4. සහාදත් වේ.

(31) ''සිෆත්'' යන අරාබි පදයේ තේරුම,

1. නම 2. ගුණ 3. ශුද්ධ 4. යටත් වීම.

(32) සමූහව ඉටුකරන සුන්නත් සලාකය වන්නේ,

1. තහජ්ජුද් 2. ලුහා 3. කරාවීහ් 4. ජුම්මා සලාතය

(33) ශිද් (අලෛ) තුමාට පහළ වූ සුහුෆු ගණන,

1. 10 2. 30 3. 40 4. 50

(34) x කොටසෙහි ඇති වචනවලට ගැලපෙන ලෙස y කොටසෙහි ඇති වචන යා කළ විට ලැබෙන පිළිවෙළ,

| x කොටස | y කොටස |
|---|---|
| 1. තස්බීහ් | A - අල්ලාහු අක්බර් |
| 2. තක්බීර් | B - සුබ්හානල්ලාහ් |
| 3. තහ්ලීල් | C - අස්තඃෆිරුල්ලාහ් |
| 4. ඉස්තිඃෆාර් | D - ලා ඉලාහ ඉල්ලල්ලාහ |

1. B A D C 2. B A C D 3. B D C A 4. A B D C

(35) අල්කුර්ආනයේ සඳහන් වී ඇති මනස් අවධීන්,

1. 2 2. 3 3. 4 4. 5

(36) නබිවරුන්ට නොතිබිය යුතු ගුණාංගවලින් එකක් වන්නේ,

1. ඥානවන්ත බව
2. සත්‍ය කතා කිරීම.
3. ප්‍රචාරය කිරීම.
4. මෝඩකම

(37) ඊමාන් යන පදයෙහි භාෂාව තුළින් දෙන අර්ථය,

1. සාක්ෂි
2. විශ්වාසය
3. දුකභාවය
4. පවිත්‍රය

(38) යහගුණ ලෙස සඳහන් නොවෙන පදය

1. හුලුක් හසන්
2. අදබ්
3. මකාරිමුල් අඛ්ලාක්
4. බිද්අත්

(39) දයාව සම්බන්ධ අල්ලාහ් තආලාගේ උසස් නාමවලින් එකක් වන්නේ,

1. අර්රස්සාක්
2. අර්රහීම්
3. අල්හාලික්
4. අල්ජබ්බාර්

(40) ''ඉමාරත්'' යනු,

1. නැමදීම
2. නියෝජිතව සිටීම.
3. පොළොව සාරවත් කිරීම.
4. අන් අයට ගෞරව කිරීම.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

16 | S | II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 10 - 2020**

**නම/විභාග අංකය : ....................................... ඉස්ලාම් ධර්මය - II** කාලය : පැය 02යි.

වැදගත් :

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) කෙටියෙන් පිළිතුරු ලියන්න.

i) තවර්රුක් හිදුම යනු කුමක්ද?
ii) අකීදා යනු කුමක්ද?
iii) තස්කියා යනු කුමක්ද?
iv) මනසෙහි තත්වයන් දෙකක් ලියන්න.
v) මග වැරදුනු චින්තන කොටස් දෙකක් ලියන්න.
vi) ආගම හා සුහුහු පහළ වූ නබිවරයා කවුද?
vii) මනස සම්බන්ධ ඉබාදත් දෙකක් ලියන්න.
viii) තයම්මුම් කිරීමට හැකි අවස්ථා දෙකක් ලියන්න.
ix) මූලික ඉබාදත් දෙකක් ලියන්න.
x) හිදායත් යනු කුමක්ද?

(02) i) සලාතයේ වැදගත්කම හඟවන හදීසයක් ලියන්න.
ii) සලාතයේ ක්‍රියාකාරිත්ව කරන ෆර්ලු 03 ක් ලියන්න.
iii) සලාතයෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

(03) i) ෆර්ලුවල කොටස් වර්ග කරන්න.
ii) අපි විශ්වාස කළ යුතු කරුණු හය ලියන්න.
iii) ඉස්ලාමීය විශාරදයන් ඉස්ලාමීය අකීදාව කෙලෙස කොටස් කර තිබේද? යනු උදාහරණ සමඟ පැහැදිලි කර ලියන්න.

(04) i) 'හදස්' යෙහි කොටස් දෙක කුමක්ද?
ii) 'නජීස්' වර්ග කීයකට බෙදිය හැකි ද? ඒවා කුමක්ද?
iii) සාමාන්‍ය ක්‍රියාවන් ඉබාදත් ලෙස මාරුවීමට තිබෙන කොන්දේසි මොනවාද?

(05) i) 'නජීස්' යන වචනයේ අර්ථය කුමක්ද?
ii) ජලයේ වර්ග උදාහරණ දී ලියන්න.
iii) සාමාන්‍ය නජීසය පිරිසිදු කරන ක්‍රමය ලියන්න.

(06) i) ආදර කිරීමේ පිළිබඳ කොටස් දෙක කුමක්ද?
ii) සූරා ලුක්මානෙහි පවසා තිබෙන හොඳ ගතිගුණ 3 ක් ලියන්න.
iii) යහගුණාංග පිළිපැදීමෙන් අප සතුවන ඵල ප්‍රයෝජන 5ක් ලියන්න.

(07) පහත සඳහන් කොටස අතරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

i) දුආ නම් ප්‍රාර්ථනා කිරීමේ වැදගත්කම
ii) අර්රිසාලාත්
iii) තයම්මුම් කරන ක්‍රම
iv) අවුරුදු

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

16 S I-II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

## ඉස්ලාම් ධර්මය පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 2 | (21) | 4 | (31) | 2 |
| (2) | 2 | (12) | 2 | (22) | 3 | (32) | 3 |
| (3) | 1 | (13) | 1 | (23) | 1 | (33) | 4 |
| (4) | 4 | (14) | 4 | (24) | 4 | (34) | 1 |
| (5) | 1 | (15) | 4 | (25) | 2 | (35) | 2 |
| (6) | 3 | (16) | 3 | (26) | 3 | (36) | 4 |
| (7) | 3 | (17) | 4 | (27) | 1 | (37) | 2 |
| (8) | 3 | (18) | 3 | (28) | 1 | (38) | 4 |
| (9) | 3 | (19) | 2 | (29) | 4 | (39) | 2 |
| (10) | 3 | (20) | 2 | (30) | 3 | (40) | 3 |

## II පත්‍රය

(01) i) අවසාන අත්තහියාත් වෙනුවෙන් ඉඳීම.

ii) ඉස්ලාමීය විශ්වාසය පිළිබඳ විවරණය

iii) සිත් පිරිසිදුකම

iv) * නෆ්සුල් අම්මාරා බිස්සුඉ    * නෆ්සුල් ලව්වාමා    * නෆ්සුල් මුත්ම ඉන්නා

v) ජබරියා, කදරියා, ෂීආ, මුඃතසිලා, හාරිජ්, මුර්ජියා

vi) මුසා නබි තුමා

vii) ඉහ්ලාස්, ඉවසීම.

viii) ජලය නොලැබුණු අවස්ථාවේදී, ප්ලාස්ටර් හෝ වෙළුම් දමන අවස්ථාවේදී

ix) සලාතය, නෝම්බි, සකාත්, ජිහාද් - හජ් යනාදී

x) යහමග

(02) i) ගැළපෙන හදීසයට ලකුණු දෙන්න.

ii) කෙළින් සිට ගැනීම, රුකූඋ කිරීම, සුජුද් කිරීම, අවසාන අත්තහියියාත් වෙනුවෙන් ඉඳීම යනාදි.

iii) පින් ලැබේ. දේව භිය ඇතිවේ., සාමය, සමඟිය, සහෝදරත්වය ශරීරයට ව්‍යායාමය යනාදි.

(03) i) ෆර්ලු අයින්, ෆර්ලු කිෆායා

ii) අල්ලාහ් තආල, මලාඉකතුල්ලාහ්, ආගම්, රසුල්වරු, පරලොව විස්තරය, කලාකද්ර්

iii) අල් ඉලාහියාත්, අන්නුබුවාත්, අර්රූහානියාත්, අස්සම්ඉයාත්

**Answer**

(04) i) හදසුල් අක්බර්, හදසුල් අස්අර්

ii) 3 * මෘදු * සාමාන්‍ය * කඨින

iii) * පිරිසිදු චේතනාව * ආගමේ අනුමැතිය * ඉස්ලාමීය කොන්දේසි පිළිපැදීම.

* මූලික නැමදුම්වලට බාධා නොවීම. * පිළිවෙළ

(05) i) අපිරිසුදුයි

ii) අල්මාඋත් තහූර් (උදාඃ- මුහුදු, ගං, වැව්, ජලය)

iii) අල්මාඋන් තාහිර් (උදාඃ- තේ, තැඹිලි)

iv) අල්මාඋන් මුතනජ්ජිස් (උදාඃ- මුත්‍රා, අරක්කු)

v) මුලින්ම නජීසය ඉවත් කිරීම, පාට, රස, සුවඳ යනාදි ඉවත් වනතුරු පිරිසිදු ජලයෙන් සේදීම.

(06) i) අල්ලාහ් තආලා කෙරෙහි ආදරය දැක්වීම.

ii) මවන ලද්දන් කෙරෙහි ආදරය දැක්වීම.

අල්ලාහ් තආලාට සම නොකිරීම (ශිර්ක් නොකිරීම)

(යහමග පෙන්වීම හා නොමඟ යැවීම) හොඳ දේවල් කියා නරක දේවල්වලින් වැළකීම.

* ඉවසීම * කටහඬ නොඉස්සීම * කීකරුව හැසිරීම.

iii) * පින් ලැබේවි. * මිනිසුන් විසින් (ප්‍රශංසා) ගෞරවය ලැබේ.

* සේවාදරය ලැබේ. * අල්ලාහ් තආලා වෙත ලංවීම.

* ස්වර්ගය ලැබේ.

(07) එක මාතෘතාවක් යටතේ අදහස් පහක් ලියවී තිබුණොත් එක අදහසකට ලකුණක් බැගින් ලකුණු පහක් දමන්න.